ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date: 27th September 202[illegible]


පැමිණිලි පාර්ශවය : ඩී.පී. තිස්ස මහතා,
හෙලඅරාවත්ත,
සීලගම.

වගඋත්තර පාර්ශවය : උ.පො.ප. සුනිල් ලෝරන්ස් මහතා
පොලිස් ස්ථානය,
සමනලවැව.

<u>පැමිණිලි අංකය : **HRC/1459/17**</u>

**පැමිණිල්ල :-**

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, 2017.04.11 වන දින තමා පරගස්තලාව, සාලිය, මිත්‍රගම හන්දිය හි සන්ධ්‍යා කුමාරි යන අයගේ කඩයේ සිටියදී වගඋත්තරකරු එම ස්ථානයට පැමිණ ජීප් රථයට නගින ලෙසට නියෝග කල බවත්, තමා ඒ පිළිබඳව හේතු විමසීමේදී වගඋත්තරකරු අතතිබූ පොල්ලකින් පැමිණිලිකරුගේ ඔළුවට, කකුලට සහ උරහිසට අමානුෂික අන්දමින් පහර දුන් බවත්ය. පසුව පොලිස් ස්ථානයට රැගෙන ගොස් පොලිස් ස්ථානයේදී පහරදී 2017.04.122 වන දින අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව කුරුවිට බන්ධනාගාරයේ බන්ධනාගාර ගත කල බවද සඳහන් කර ඇත.

තවද, පැමිණිලිකරු පහරදීම සම්බන්ධයෙන් බන්ධනාගාර රෝහලෙන් ප්‍රතිකාර ලබාගත් බවත්, 2017.04.18 වන දින ඇප මත නිදහස් වීමෙන් පසුව පහරදීම නිසා ඇතිවූ රෝගී තත්ත්වයට 2017.04.27 වන දින ඔළුගම්තොට රෝහලට ඇතුළු වී 2017.04.29 වන දින දක්වා ප්‍රතිකාර ලබාගත් බවත්, ඉන්පසුව 2017.04.30 වන දින රත්නපුර රෝහලට ඇතුළු වී 2017.05.01 දින දක්වා නේවාසික ප්‍රතිකාර ලබාගත් බවත් සඳහන් කර ඇත.




ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580 / 81 / 82
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@gmail
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

පැමිණිලිකරු බන්ධනාගාර රෝහලෙන් ප්‍රතිකාර ලබාගත් බවට සනාථ කිරීම සඳහා කුරුවිට බන්ධනාගාරයෙන් වාර්තාවක් කැඳවා ඇත. එම වාර්තාවට අනුව 2017.04.12 වන දින බලංගොඩ මහේස්ත්‍රාත් නඩු අංක : බී 243/17 දරණ නඩුව යටතේ බන්ධනාගාරයට ඇතුළු කර ඇති අතර, බන්ධනාගාරයට ඇතුළු කරන අවස්ථාවේදී වගඋත්තරකරු විසින් පහරදුන් බවට බන්ධනාගාරය වෙත දැන්වීමෙන් අනතුරුව බන්ධනාගාර රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබාදුන් බවට සඳහන් කර ඇත. නමුත්, 2017.04.12 වන දින සිට සිංහල හින්දු අළුත් අවුරුද්ද නිසා වෛද්‍යවරයා රෝහල වෙත පැමිණ නැති බවත්, නමුත් වෛද්‍යවරයා අමතා රෝගී උපදෙස් අනුව සුළු ප්‍රතිකාර ලබාදී ඇති බවත්, 2017.04.27 වන දින වෛද්‍යවරයා රෝහලට පැමිණීමෙන් පසුව එදින සැකකරුව බලංගොඩ සිර මැදිරියට මාරු කර ඇති බව ද වාර්තා වේ. එසේම, 2017.04.18 වන දින ඇප මත මුදාහැර ඇති බව සඳහන් වේ.

රත්නපුර අධිකරණ වෛද්‍යවරයාගෙන් අධිකරණ වෛද්‍ය වාර්තාව කැඳවා ඇති අතර, අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුව 01 සිට 05 දක්වා බරපතල නොවන තුවාල 05 ක් ඇති බව සඳහන් වේ. අධිකරණ වෛද්‍ය වාර්තාවේ 04 වන කරුණ යටතේ තුවාල සිදුවී ඇති අයුරු වින්දිතයා විසින් කරන ලද රෝග ඉතිහාසය අනුව සැසඳෙන බවද සඳහන් වේ.

**වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-**

පැමිණිල්ල සම්බන්ධයෙන් උධෘත සහිත වාර්තාවක් වගඋත්තරකරු විසින් කොමිෂන් සභාව වෙත ලබාදී ඇත. ඊට අමතරව වගඋත්තරකරු කරුණු දක්වමින් ප්‍රකාශ ඇත්තේ, 2017.04.11 වන දින පැය 16.45 ට උයන්ගොඩගේ සෙනරත් ජයසූරිය නැමති අය පොලිස් ස්ථානයට පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු බීමත්ව පැමිණ තමාට පහරදුන් බවත්, තමාගේ කුඩා දියණියට බැල්ලී කියා බැණ වැදුනු බවත්ය.

එම පැමිණිල්ල සමනලවැව පොලිස් ස්ථානයේ CIB 252/77 යටතේ සටහන් කර ඇති අතර, ඊට අදාල විමර්ශනය සඳහා LF/3336 දරණ ජීප් රථයෙන් පො.සැ. 23225 තිහාල්, පො.කො. 34144 තිලකරත්න, පො.කො. 77725 තෙන්නකෝන් යන නිලධාරීන් සමග වගඋත්තරකරු ද ගිය බව සඳහන් කර ඇත. එසේම, පැමිණිල්ලේ සඳහන් වෙළඳසැල අසලදී තමාට පහරදුන් අය ත්‍රිවිල් රථයකින් යන බවට පැමිණිලිකාරිය විසින් ප්‍රකාශ කිරීම මත වහා ක්‍රියාත්මක වී නිලධාරීන් සමග අදාල රථය නවතා පරීක්ෂා කළ බවත්, එම පැමිණිල්ලේ පැමිණිලිකරු රථය පැදවීමට සුදුසු තත්ත්වයේ නොසිටි බවත්, තමාවම පාලනය කිරීමට නොහැකි තත්ත්වයෙන් බීමත්ව රිය පැදවීම සහ පහරදීම සම්බන්ධයෙන් චෝදනා කියාදී පැය 17.10ට අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානයට රැගෙන ආ බවත් සඳහන් කර ඇත. ඉන්පසුව එදිනම අධිකරණ වෛද්‍ය පෝරම 13/2010 යටතේ රෝහලට ගෙන යාමට පිටත්වූ බවත්, වෛද්‍යවරයා වෙත පරීක්ෂා කිරීමට

ගෙනයාමේදී සැකකරු අධික බීමත්ව සිටි හෙයින්, එම අවස්ථාවේදී පලා යාමට උත්සාහ කරන ලද බවත්, නිලධාරීන් සමඟ මහත් පරිශ්‍රමයක් යොදා මෙල්ල කරනු ලැබූ බවත්, අවශ්‍ය අවම බලය පාවිච්චි කර සැකකරු වෛද්‍යවරයා වෙත රැගෙන ගිය බවත්ය. ඒ අවස්ථාවේදී ඔහු විසින් එල්ල කරනු ලැබූ පහරක් වගඋත්තරකරුගේ වම් ඇසට ඉහළින් වැදුනු බවත්, ඒ සඳහා ප්‍රතිකාර ලබාගත් බවත් සඳහන් කර ඇත.

ඉන්පසුව බෙලිහුල්ඔය රෝහලේ දිසා වෛද්‍ය නිලධාරි බණ්ඩාර මහතාට ඉදිරිපත් කිරීමෙන් පසුව අදාල වෛද්‍ය පෝරමයේ මත්පැන් බී වෙරි වී සිටින බවට වෛද්‍යවරයා සටහන් කල බව සඳහන් කර ඇත. අනතුරුව සැකකරු කලහකාරි ලෙස හැසිරෙන බැවින්, උපසේවයට ඔහු ගැන පරික්ෂාවෙන් සිටින ලෙසට දන්වා ඔහුගේ ආරක්ෂාව සඳහා සිර මැදිරියේ අත් විලංගු දමා තිබූ බවත්, ඒ සඳහා අවශ්‍ය සටහන්, තොරතුරු සටහන් පොතේ යොදා ඇති බවත් සඳහන් කර ඇත.

පසුව අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව සැකකරු 2017.04.18 වන දින දක්වා බන්ධනාගාර ගත කල බවත්, අධිකරණයට ඉදිරිපත් කරන අවස්ථාවේදී සැකකරුට පහරදුන් බවට සඳහන් නොකල බව ද, එසේ පහරදීමක් සිදුකලේ නම් මහේස්ත්‍රාත්වරයාට කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාව තිබූ බව ද සඳහන් කර ඇත.

**තිරීක්ෂණ :-**

කුරුවිට බන්ධනාගාරයේ බන්ධනාගාර ගත කරන අවස්ථාවේදී පැමිණිලිකරුට පහරදුන් බවට ප්‍රකාශ කර ඇති අතර, බන්ධනාගාර තොග ගණනය පොතේ ඒ බව සටහන් කර ඇති බවට බන්ධනාගාරය විසින් ඉදිරිපත් කර ඇති එම පොතෙහි උද්ධෘත මගින් තහවුරු වේ. තවද, බන්ධනාගාරය විසින් සුළු ප්‍රතිකාර ලබාදුන් බවද වැඩිදුරටත් එහි සඳහන් වී ඇත.

රත්නපුර රෝහලේ අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුව පැමිණිලිකරු 2017.04.30 දින රෝහල් ගත වී ඇති අතර, රෝගියා විසින් දෙන ලද කෙටි ඉතිහාසයේ වගඋත්තරකරුවන් විසින් පහරදුන් බවට සඳහන් කර ඇත. එසේම, වෛද්‍ය වාර්තාවේ බරපතල නොවන තුවාල පහක් ඇති බවට සඳහන් කරන අතර, රෝගියාගේ කෙටි ඉතිහාසය හා එම තුවාල සැසඳෙන බවට සඳහන් කර ඇත.

තවද, පැමිණිලිකරුට විරුද්ධව බීමත්ව රිය පැදවීම, පහරදීම යටතේ බී/243/2017 යටතේ බලංගොඩ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් පවරා ඇති බවද තිරීක්ෂණය වේ.

නිගමනය :-

ඉහත නිරීක්ෂණ වලට අනුව පහරදීම සම්බන්ධයෙන් බන්ධනාගාරයට පැමිණිලි කර ප්‍රතිකාර ලබාගැනීම සහ අධිකරණ වෛද්‍ය වාර්තාවේ සඳහන් වන ආකාරයට පැමිණිලිකරුව කෲර සහ අවමන් සහගත වධහිංසාවකට ලක් කර ඇති බවට තහවුරු වේ. ඒ අනුව 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන වගන්තියෙන් සහතික කර ඇති මූලික අයිතිවාසිකම උල්ලංඝනය කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

__අමල් සුදත් සිල්වා එරෙහිව කොඩිතුවක්කු__ නඩුවේ දක්වා ඇත්තේ කිසියම් තැනැත්තෙකු වධහිංසාවකට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුතු බවයි. එසේම, 11 වන ව්‍යවස්ථාව මගින් විධානය කරන්නේ යම් තැනැත්තෙකු විසින් වෙනත් තැනැත්තෙකු වෙත වධහිංසාවක්, කෲර හෝ අමානුෂික සැලකීමක් දැක්වීම තහනම් කරනු ලබන බවයි. එසේම, එම අයිතිවාසිකම කිසියම් සීමාවකට හෝ අඩු කිරීමකට යටත් කර නොමැති පරම මූලික අයිතිවාසිකමක් බවයි. එසේම, අපරාධකරුවෙකු වුවද, එසේ නොවුවද රටේ සෑම තැනැත්තෙකුටම මෙම අයිතිවාසිකම ඇති බවත්, මෙම අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට රජයේ අංශයක් වන පොලිස් බලකායට වුවද කිසියම් අවස්ථාගත කරුණක් යටතේ එම අයිතිවාසිකම් ප්‍රතික්ෂේප කිරීම, අඩු කිරීම හෝ සීමා කිරීම නොකළ යුතු බවත්ය.

__ඉෂාරා අංජලී එරෙහිව වර්ණ බෝගහවත්ත__ නඩුවේදී 11 වන ව්‍යවස්ථාව තවදුරටත් තීව්‍ර කර ඇති අතර, අධිකරණයෙන් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත්තේ, නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් විසින් කිසිදු පුද්ගලයෙකු කෲර හා අවමන් සහගත සැලකිල්ලකට ලක් නොකළ යුතුය යන්නයි.

තවද, සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ 7 වන වගන්තියේ ද වධදීම හා අනෙකුත් කෲර අමානුෂික හෝ නින්දිත සැලකීමකට හෝ දඬුවමකට එරෙහි සම්මුතිය යටතේ ද කෲර හා වධහිංසාවකට ලක්කිරීම නොකළ යුතු බවට අවධාරණය කර ඇත.

නිර්දේශය =:

01. ඒ අනුව ඉහත කරුණු සියල්ල සලකා බැලීමේදී 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 11 වන ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කර ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම ඉහත වගඋත්තරකරු විසින් කඩ කර ඇති බැවින්, එමගින් පැමිණිලිකරුට සිදුවූ අගතිය සම්බන්ධයෙන් රු. 10,000/- ක මුදලක් ගෙවන ලෙසට වගඋත්තරකරු වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

02. මෙම නිර්දේශයේ පිටපතක් පොලිස්පතිවරයා වෙතද යොමුකරනු ලබන අතර, වගඋත්තරකරුගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් සුදුසු විනයානුකූල පියවර ගන්නා ලෙසට පොලිස්පතිවරයා වෙත නිර්දේශ කරනු ලැබේ.

2021. 11. 2[illegible] වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාල දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

අනුසුයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Ms. Anusuya Shanmuganathan**
Commissioner
Human Rights Commissioner of Sri Lanka

ම.හේ නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Dr. M.H. Nimal Karunasiri**
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :- පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

B/